# සංවර්ධන ප්‍රයත්නයකදී ලද අත්දැකීම්

## (මොරගොල්ල ව්‍යාපෘතිය ඇසුරින්)

### ක්‍රියාබද්ධ පර්යේෂණ

ක්‍රියාබද්ධ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී සමාජ-ආර්ථික පර්යේෂකයින්ට ග්‍රාමීය සංවර්ධන කාර්යයන්හි සෘජුවම නියැලීමට අවස්ථාව සැලසේ. තෝරාගත් ගම්මානයක සමීක්ෂණ ව්‍යාපෘතිය වසර කිහිපයක් තිස්සේ ක්‍රියාත්මක වන අතර එහිදී දිගුකලක් ග්‍රාමීය ජනතාව සමඟ ඉතා සමීපව ක්‍රියාකිරීමටත් ඔවුන් සමඟ අන්‍යෝන්‍යව මිත්‍රවීමෙන් ඔවුන් පිළිබඳව විණිවිද දැකීමටත් පර්යේෂකයින්ට අවස්ථාව සැලසේ.

මෙම ලිපියේදී මා බලාපොරොත්තු වන්නේ ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොරගොල්ල ගමේ ක්‍රියාත්මක කරන ලද ක්‍රියාබද්ධ පර්යේෂණ වැඩ සටහනක් වූ "සුළු ගොවීන් සඳහා කෘෂිතාක්ෂණ සහාය සේවා විධිමත් කිරීමේ වැඩසටහන "නම්වූ පර්යේෂණ ව්‍යාපෘතියට සම්බන්ධ වීමෙන් මා ලද අත්දැකීම් විශ්ලේෂණය කිරීම මඟින් ග්‍රාමීය ජනසමාජයක් විනිවිද දැකීමට උත්සාහ කිරීමයි. ව්‍යාපෘතියේ එක් එක් අවස්ථාවේ ක්‍රියාත්මක කෙරුණු කාර්යයන් අනුව ඒවාට ජනතාව දැක්වූ ප්‍රතිචාර තුළින් ඒවාට පාදකවූ ආර්ථික, සාමාජික හා දේශපාලනික පසුතලයන් පිළිබඳවද විමසා බැලේ.

මෙම ව්‍යාපෘතියේ ක්‍රියාබද්ධ කොටස වනුයේ විධිමත් පවතින කෘෂිකර්ම තාක්ෂණ සහාය සේවා ගමේ ගොඩනගන ලද ප්‍රජා සංවිධානයකට සම්බන්ධ කිරීම මඟින් කෘෂිකාර්මික කටයුතුවලට අත්වැලක් සැපයීමෙන් ප්‍රදේශයේ කෘෂිකාර්මික සහ සමාජීය දියුණුවක් ඇති කිරීමයි. මෙම අභිමතාර්ථයන් ඉෂ්ට කර ගැනීමට යාමේදී ඊට ජනතාව ප්‍රතිචාර දක්වන ආකාරයත් මතුවන ගැටළු මොනවාද යන්නත් ඒවාට හේතුවූ කරුණු සහිත පසුබිම කුමක්ද යන්නත් එහිදී පැනනඟින ගැටළු විසඳීම සඳහා යෙදිය යුතු පිළියම් මොනවාද යන්නත් ඉතා සූක්ෂමව පර්යේෂණය කිරීම මෙහි පර්යේෂණ කොටසට අයත්වේ.

### 2. ව්‍යාපෘති ක්ෂේත්‍රය

මාතලේ දිස්ත්‍රික්කයේ අතරමැදි කලාපයේ පිහිටා ඇති මොරගොල්ල ග්‍රාමසේවා වසමෙහි පවුල් 136ක් පමණ වාසය කරයි. ඉතාසුළු සංඛ්‍යාවක් හැර ගමේ සියළුම පවුල් කෘෂිකර්මාන්තයේ නියැලී සිටී. එක් පවුලකින් එක් අයෙකු ව්‍යාපෘතියට සම්බන්ධ වී සිටී. මෙසේ සම්බන්ධවී සිටින සියළුම දෙනා වයස අවුරුදු 25 සිට අවුරුදු 65 දක්වා වයස් පරාසයකට ඇතුළත් වේ. ප්‍රදේශයට ආවේණික අතරමැදි කාලාපීය දේශගුණික තත්ත්වය අනුව මාස්කන්නයෙහි වී වගාවත් යල්කන්නයෙහි ලොකු ළූණු සහ මිරිස් වැනි මුදල් බෝග වගාවත් ඊට අමතරව හේන් වගාවත් කරනු ලබයි. වසර මුළුල්ලේම ගොවිතැන් කටයුතුවල නියලීම නිසා මෙම ජනයාගේ ජීවිත කළබලකාරීත්වයක් ඉසිලුව ද කෘෂිකර්මාන්තයේ නියැලි ගැමියෙකු ලබන විවේකය හා ගමේ සරළ දිවිපැවැත්ම මොවුන් කෙරෙහි දක්නට ඇත.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරී ආර්.එල් එන්. ජයතිස්ස විසිනි.

### 3. ව්‍යාපෘතිය ක්‍රියාත්මක යන්ත්‍රණය

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන යන්ත්‍රණය වනුයේ කුඩා කණ්ඩායම් සහ ඒ ආශ්‍රයෙන් ගොඩනගනු ලබන ග්‍රාමීය සංවර්ධන සභාවයි. කුඩා කණ්ඩායම් නිර්මාණය කරනුයේ ජනතාව හමුවීමට සහ සාකච්ඡා කිරීමට පහසුවන පරිදි ගම කුඩා කොටස්වලට වෙන් කිරීමෙන් ඒ එක් එක් කොටසේ කුඩා කණ්ඩායමක් ඇති කිරීමෙනි. එක් එක් කුඩා කණ්ඩායමකට නායකයෙකු සහ උපනායකයෙකු කණ්ඩායමේ කැමැත්ත මත පත්කෙරේ. මෙම කණ්ඩායම් නායකයින් විසින් ඔවුන් අතුරින් කෙනෙකු මෙම සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගනී. මෙම සභාව ග්‍රාමීය සංවර්ධන සභාව නමින් හඳුන්වනු ලබයි. මසකට වරක් මෙම සභාව රැස්වන අතර මෙම රැස්වීම සඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණ නිළධාරීද සහභාගිවනු ලබයි. කුඩා කණ්ඩායම්වල වගකීම වනුයේ තම කණ්ඩායම් රැස්වීම් මසකට වරක් පවත්වා කුඩා කණ්ඩායම් සාමාජිකයින්ගේ කෘෂිකාර්මික ගැටළු හා තාක්ෂණික අවශ්‍යතා පිළිබඳව විමසීමක් කර එම අදහස් මෙම ග්‍රාමීය සංවර්ධන සභාවේ මාසික රැස්වීමට ඉදිරිපත් කිරීමයි. එහිදී ඉදිරිපත් වන අවශ්‍යතා අනුව අදාළ කෘෂිතාක්ෂණ සහාය ලබාදීමට නිළධාරීන් මෙම ග්‍රාමීය සංවර්ධන සභාව සමඟ සම්බන්ධ කළහැකිය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකරනුයේ ගොවි ජනතාව මුහුණපාන විවිධ වර්ගයේ කෘෂිකාර්මික ගැටළු විසඳා ගැනීම සඳහාත්, පවතින කෘෂිකාර්මික කටයුතුවල විවිධත්වයක් ඇති කරගැනීම සඳහාත් කෘෂිතාක්ෂණ සහාය සේවා ලබා ගැනීම සඳහා

ජනතාව සංවිධානාත්මක ඒකකයකට ගොනු කොට ශක්තිමත්ව පවත්වාගෙන යාම සඳහා ඔවුන්ට අවශ්‍ය පිටුබලය සැපයීමයි. මෙම සමස්ථ ක්‍රියාවලිය සඳහා ගොවිජනතාව දක්වන ප්‍රතිචාරය සියුම්ව විශ්ලේෂණය කිරීම පර්යේෂණ කොටසින් සිදුකෙරේ.

## 4. ක්‍රියාත්මක අවධියේදී ලද අත්දැකීම්

### 4.1 ජනතා සහභාගිත්වය

මුලින්ම දක්නට ලැබුනේ ව්‍යාපෘතිය සඳහා සංඛ්‍යාත්මක වශයෙන් විශාල ගොවීන් සංඛ්‍යාවක් ආරම්භයේදී අප විසින් සංවිධානය කරන ලද රැස්වීම්වලට සහභාගිවීමයි. මෙම රැස්වීම්වලදී ව්‍යාපෘතිය පිළිබඳ මූලික වැටහීමක් ගොවිජනතාවට ද ලබාදීමට උත්සාහ කළෙමු. මේ අනුව මුලින්ම පෙනී ගිය කරුණ නම් මුලින් විශාල පිරිසක් පැමිණියේ මෙම ව්‍යාපෘතිය මගින් යම් කිසිවක් ලැබේවිය යන බලාපොරොත්තුවෙනි. මෙසේ මුල්කාලයේ

රැස්වූ විශාල පිරිස පසුව අඩුවීමෙන් පෙනුනේ මෙයින් යම්කිසිවක් ක්ෂණිකව නොලැබෙන බවදැනගත් නිසා දීමනා මානසිකත්වයෙන් පැමිණි පිරිස ඉවත්වූ බවයි. කුඩා කණ්ඩායම් ගොඩ නැංවීම සඳහා ගමේ එක් එක් කොටස්වල පැවැත්වූ රැස්වීම්වලට පැමිණියේ අඩු පිරිසකි. එම පිරිස මෙම ව්‍යාපෘතිය පිළිබඳව විශ්වාසයෙන් යුක්තව පැමිණි අයවෙයි.

### 4.2 කුඩා කණ්ඩායම්

කුඩා කණ්ඩායම් සඳහා කණ්ඩායම් නායකයන් පත්කිරීමේදී පෙනීගියේ නායකත්වයට පත්වීමට කුඩා කණ්ඩායම්වල ජනතාව තුළ කැමැත්තක් තිබුනද නායකත්වයට පත්වීම සඳහා පසුබාන තත්ත්වයකි. මීට හේතු ලෙස පෙනීගියේ කණ්ඩායම් නායකයෙකු වශයෙන් පත්වන පුද්ගලයාට තම කණ්ඩායම වෙනුවෙන් පැවරෙන වගකීම් ඉටුකිරීමට හැමදෙනෙකුටම හැකියාවක් නැතිකම, ප්‍රජා නායකයන් වශයෙන් ඉදිරිපත්වීමට ඇති බිය හා පසුබාන ගතිය ගැමි සමාජය සතුව පවතින ගුණාංගයි.

කුඩා කණ්ඩායම් ඇතිකිරීමෙන් ව්‍යාපෘතිය බලාපොරොත්තු වූයේ ව්‍යාපෘතියට සම්බන්ධ වී සිටින සෑම දෙනෙකුටම කෘෂිකාර්මික ගැටළු සහ කෘෂිකර්මය සම්බන්ධව ඔවුන්ට තවදුරටත් අවබෝධයක් ලබාදී ඔවුන්ට අවශ්‍ය කෘෂිතාක්ෂණ සහාය සේවා මොනවාදැයි ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වල සාමාජිකයන්ට අවස්ථාව ලබාදිය යුතු වුවද නියමිත පරිදි ක්‍රමාණුකූලව කුඩා කණ්ඩායම් රැස්වීම් පැවැත්වී නැත. එයට හේතු දෙකක් වෙයි. එකක්නම් කුඩා කණ්ඩායම් නායක සහ උපනායක විසින් කුඩා කණ්ඩායම් රැස්කිරීමට උත්සාහයක් ගත්තද සාමාජිකයින් ඒ සඳහා සහභාගි නොවීමයි. සාමාජිකයින්ට මෙය නුහුරු නුපුරුදු දෙයක් බැවින් ඔවුන් කුඩා කණ්ඩායම් රැස්වීම්වලට සහභාගිවීමට උනන්දුවූයේ නැත. එවැනි තත්ත්වයක් ඇති වීමට පසුබිම්වූ කරුණ වූයේ කුඩා කණ්ඩායම් වශයෙන් රැස්වීමෙන් ප්‍රයෝජනයක් නැති බවත් රැස්වීම්වලට සහභාගිවීමට යොදන කාලය තමන්ගේ වෙනත් දෛනික කාර්යයක යෙදීම තමාට වඩා වාසි සහගත බවයි. කණ්ඩායම් නායක කල්පනා කරන ලද්දේද තමා කණ්ඩායම් නායකයෙකු වුවත් කුඩා කණ්ඩායම් සාමාජිකයන් සොයා ගොස් ඔවුන් රැස්වීම්වලට සහභාගිකරවා ගැනීමට වෙහෙස දැරීමට වඩා තමාගේ පෞද්ගලික කාර්යයක යෙදීම වඩා ලෙහෙසි හා වාසිසහගත බවයි. මේ නිසා සිදුවූයේ කුඩා කණ්ඩායම් රැස්වීම් නියමිත පරිදි රැස්වී අදහස් ලබාගන්නේ නොමැතිව කණ්ඩායම් නායකයා පමණක් කෘෂි තාක්ෂණ සහාය සේවා රැස්වීමට සහභාගිවීමයි.

කණ්ඩායම් නායකයින් අදහස් ඉදිරිපත් කළද ඒ කණ්ඩායමේ අදහස් නොව නායකයන්ගේ අදහස් පමණක් විය. මෙම කුඩා කණ්ඩායම් ක්‍රමය තුළින් බලාපොරොත්තු වූයේ සෑම පුද්ගලයෙකුටම තම කෘෂිකාර්මික කටයුතු හා සම්බන්ධ වූ දිවිපෙවත දියුණු කරගැනීම සඳහා නිර්මාණශීලී අදහස් ඉදිරිපත් කරමින් පුළුල් ජනතා සහභාගිත්වයක් සහතික කිරීමයි. එහෙත් තත්ත්වය මෙයට හාත්පසින්ම වෙනස්වීමට හේතුව තම සංවර්ධනය වෙනුවෙන් සිය නිර්මාණශීලී අදහස් ඔවුන් තුළින්ම ගලා ඒමේ ගතියක් ගමෙහි ජනතාව තුළ නොවීමයි. අනෙක් හේතුව නම් ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා ජනතාවගේ සහාය, අදහස් හා පුළුල් ජනතා සහභාගිත්වයක් ලබාගැනීමේ පුරුද්දක් මෙතෙක් කලක් නොපැවතීම නිසා ජනතා සිතුම් පැතුම්

කුඩා කණ්ඩායම් ඇතිකිරීමෙන් ව්‍යාපෘතිය බලාපොරොත්තු වූයේ ව්‍යාපෘතියට සම්බන්ධ වී සිටින සෑම දෙනෙකුටම කෘෂිකාර්මික ගැටළු සහ කෘෂිකර්මය සම්බන්ධව ඔවුන්ට තවදුරටත් අවබෝධයක් ලබාදී ඔවුන්ට අවශ්‍ය කෘෂිතාක්ෂණ සහාය සේවා මොනවාදැයි ඉදිරිපත් කිරීමට කණ්ඩායම්වල සාමාජිකයන්ට අවස්ථාව ලබාදිය යුතු වුවද නියමිත පරිදි ක්‍රමාණුකූලව කුඩා කණ්ඩායම් රැස්වීම් පැවැත්වී නැත. එයට හේතු දෙකක් වෙයි. එකක් නම් කුඩා කණ්ඩායම් නායක සහ උපනායක විසින් කුඩා කණ්ඩායම් රැස්කිරීමට උත්සාහයක් ගත්තද සාමාජිකයින් ඒ සඳහා සහභාගි නොවීමයි. සාමාජිකයින්ට මෙය නුහුරු නුපුරුදු දෙයක් බැවින් ඔවුන් කුඩා කණ්ඩායම් රැස්වීම්වලට සහභාගිවීමට උනන්දුවූයේ නැත.

ප්‍රදේශයේ ගොවීන් ලොකු ළූණු මිරිස් කව්පි මුං ඇට සහ වී යන බෝග වර්ග වෙළඳපළ සඳහා වගාකරයි. එහෙත් එම බෝග ඉහළ මිලක් ලබාගත හැකිවන ආකාරයේ උසස් ගුණාත්මකභාවයකින් යුක්ත නැත. මිල වැඩිවන තුරු ගබඩාකර කල්තබා ගැනීමට හෝ වෙළඳපොලේ ඉහළ මිල ගණන් යටතේ තරඟකිරීමට හැකියාවක් ඒවාට නැත. මෙම තත්ත්වය කල්පනා කළ ව්‍යාපෘති නිලධාරීන් අනර්ඝත්වයේ කෘෂිබෝග වගා කිරීමට සහ වගාවේ නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීම සඳහා වූ නවවගා ක්‍රම පිළිබඳව පුහුණු විශේෂඥයින් ගමට ගෙන්වා ගොවීන්ට ඒ ගැන පුහුණුවක් දීමට උත්සාහයක් ගත්තේය.

සියල්ලම රජය විසින් ඉටුකර දේවි යන ආකාරයටය. මේ නිසා පුළුල් ජනතා නියෝජනයක් ග්‍රාමීය සංවර්ධන කටයුතුවලදී ලබාගැනීමට ජනතාව තුළම පවතින ආකල්ප හා පුරුදු හේතුවෙන් අපහසු වී ඇති අතර සංවර්ධන ආකල්පවලින් සමන්විත නිර්මාණශීලි නව අදහස් ජනතාව තුළ බිහිවීමත්, ඒවා අදාළ තැන්වලදී ප්‍රකාශවීමත් සිදු නොවේ. ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන ක්‍රමය විසින්ද ජනතාව හැඩ ගස්වා ඇත්තේ ගැති මානසික ස්වභාවයකටය. මේ නිසා ස්වාධීනව සිතීමට හා අළුත් අදහස් ඉදිරිපත් කිරීමට හැකි මානසික වාතාවරණයක් ඔවුන් තුළ ගොඩනැගී නැති අතර, නිලධාරීන්ට යටත්ව සිටීමේ සහ ඔවුන් අනුගමනය කිරීමේ මානසික තත්ත්වයක ඔවුන් පසුවේ.

## 4.3 ග්‍රාමීය සංවර්ධන සභාව

ග්‍රාමීය සංවර්ධන සභාවේ මාසික රැස්වීම සඳහා සියළුම කණ්ඩායම් නායකයින් සහභාගිවිය යුතු වුවත්, ඇතැම් කණ්ඩායම් නායකයින් නියමිත පරිදි මෙම රැස්වීම්වලට සහභාගී නොවන තත්ත්වයක් දක්නට ලැබුණි. ඇතැම් දිනවල අප නිලධාරීන්ට මෙම රැස්වීම පැවැත්වීමට කලින් කණ්ඩායම් නායකයන්ගේ නිවෙස්වලට ගොස් ඔවුන්ට රැස්වීමට පැමිණෙන ලෙස ඉල්ලා සිටීමට සිදුවූ අවස්ථාද බහුලව පැවතිනි. කණ්ඩායම් නායකයන් වුවද මෙවැනි උදාසීන භාවයක් පෙන්නුම් කරනුයේ මෙම ව්‍යාපෘතිය මගින් ක්ෂණිකව එනම් මාස්පතා හෝ යමක් ද්‍රව්‍යමය වශයෙන් නොලැබීමයි. මෙමගින් කෘෂිකාර්මික දැනුම වැනි අදෘෂ්‍යමාන දේ ලැබුණද එය එතරම් කැපී පෙණෙන සහ විශෙෂිත දෙයක් නොවිණි.

## 4.4 තාක්ෂණ සහාය සේවාවන්

**විවිධ කෘෂි ක්ෂේත්‍රයන් සම්බන්ධව කෘෂි තාක්ෂණ නිළධාරීන්ගේ උදාඃ-පොල් වගා ව්‍යාප්ති, කජු වගා ව්‍යාප්ති වැනි තාක්ෂණික සේවාවන් කෘෂි තාක්ෂණික සහාය සේවා මධ්‍යස්ථානය හරහා ජනතාවට හඳුන්වා දීම සිදුවිය. කණ්ඩායම් නායකයින් විසින් කුඩා කණ්ඩායම්වල අදහස් ලබා ගනිමින් ඒවා තම කණ්ඩායම්වල අවශ්‍යතාවට අදාළ තාක්ෂණ සේවාවන් ලබාගැනීම සඳහා ස්වේච්ඡාවෙන් ඔවුන් හමුවීමට ගොස් එම සේවාවන් ලබාගැනීමට එතරම් කැපකිරීමකින් ක්‍රියාකළ බවක් දක්නට නැත. අදාළ කෘෂිතාක්ෂණ නිළධාරීන් ගමට පැමිණ කෘෂි සේවාවන් ලබාදීමට ක්‍රියාකළහොත් හැර ගොවි මහතුන් විසින් ඔවුන් හමුවීමට යාමක් දක්නට ලැබුනේ නැත. මෙයින්ද පෙනී ගියේ වර්තමානයේ ඔවුන් නියැලී සිටින ගොවිතැන් හුරුපුරුදුවලින් ඔබ්බට යාමට ඔවුන් මැලිකමක් දක්වන බවයි. එවැනි සිතුම් පැතුම්වලින්** යුක්තවන හෙයින් තම ග්‍රාමීය වටා පිටාව තුළ ඇති සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලැබෙන අයුරින් එවා නිෂ්පාදන ක්‍රියාමාර්ගවල යෙදවීමටත් මෙම ව්‍යාපෘතිය වැනි ඔවුන්ට ලැබෙන අවස්ථාවලින් උපරිම ප්‍රයෝජනය ලබා ගෙන තම ජීවන තත්ත්වයන් නඟාසිටුවා ගැනීමටත් ජනතාව තුළම බාධකයක් පවතින බව පෙනීයයි.

## 4.5 කෘෂි පුහුණු පංති

ප්‍රදේශයේ ගොවීහු ලොකුළූණු, මිරිස්, කව්පි මුං ඇට සහ වී යන බෝග වර්ග වෙළඳපළ සඳහා වගා කරනු ලබති. එහෙත් එම බෝග ඉහළ මිලක් ලබාගත හැකිවන ආකාරයේ උසස් ගුණාත්මක භාවයකින් යුක්ත නැත. මිල වැඩිවන තුරු ගබඩාකර කල්තබා ගැනීමට හෝ වෙළඳපොළේ ඉහළ මිල ගණන් යටතේ තරඟකිරීමට හැකියාවක් ඒවාට නැත. මෙම තත්ත්වය කල්පනා කළ ව්‍යාපෘති නිළධාරීන් අනර්ඝත්වයේ කෘෂිබෝග වගා කිරීමට සහ වගාවේ නිෂ්පාදන පිරිවැය අඩුකර ගැනීම සඳහා වූ නව වගා ක්‍රම පිළිබඳව පුහුණු විශේෂඥයින් ගමට ගෙන්වා ගොවීන්ට ඒ ගැන පුහුණුවක් දීමට උත්සාහයක් ගත්තේය. එහෙත් සැළකිය යුතු ප්‍රමාණයක ගොවින් සංඛ්‍යාවක් මෙම පුහුණු පංති සඳහා සහභාගි වූයේ නැත. මෙහිදී වැඩි ගොවීන් සංඛ්‍යාවක් සහභාගි නොවූයේ ඔවුන්

වසර පුරා මෙම බෝග වර්ග වගාකරන හෙයින් ඒවා වගාකිරීම පිළිබඳව ඔවුන්ට ප්‍රමාණවත් දැනුමක් ඇතිබවත්, එම නිසා වෙනත් අමතර දැනීමක් අවශ්‍ය නැතැයි කල්පනා කළ හෙයිනි. මෙවැනි ආකල්ප නිසා තරඟකාරී වෙළඳපළ සඳහා උසස් අනර්ඝත්වයෙන් යුක්ත වූ බෝග වගාකිරීමට මෙම ගොවීන්ට නොහැකිවී ඇති අතර, ඒ නිසාම ඒවා අලෙවිකිරීමට සිදුව ඇත්තේද පහත් මිල ගණන් යටතේයි.

## 4.6 ගොවි සංවිධානය

ගොවීන් ග්‍රාමීය මට්ටමේ සංවිධානාත්මක ඒකකයකට ගොනු කිරීම තුළින් ගොවීන්ගේ කෘෂිකාර්මික අවශ්‍යතාවන් සපුරාලීම සහ ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ග්‍රාමීය මට්ටමේ පිහිටුවා ඇති සංවිධානයකි, ගොවි සංවිධානය. මෙම ගමෙහිද ගොවි සංවිධානයක් පිහිටුවා ඇතත් එය අක්‍රිය සංවිධානයකි. නාමිකව ඇති රටේ වෙනත් ගොවි සංවිධාන මෙන්ම මෙයද තවත් එකකි. අප විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගමේ ගොවි සංවිධානය ඉතා සහයෝගයෙන් ක්‍රියාකළ යුතුවුවත් ඔවුන්ගෙන් ක්‍රියාකාරි සහයෝගයක් අපට ලැබුනේ නැත. ගොවි සංවිධානය සම්බන්ධව විමර්ශනය කිරීමේදී පෙනී ගියේ ගොවි සංවිධාන නිළධාරීන් හා පවත්නා දේශපාලනය අතර දැඩි සම්බන්ධතාවක් පවතින බවයි. දේශපාලනය ග්‍රාමීය මට්ටමේදී ආයතන ගත කිරීමේ එක් වනු ක්‍රියාමාර්ගයක් වනුයේ ගොවි සංවිධානයේ නායකත්වයට පාලක පක්ෂය හිතවත් ක්‍රියාකාරි සාමාජිකයෙකු පත්කිරීමයි. මේ හේතුව නිසා ගොවි සංවිධානය ගොවීන්ගේ අවශ්‍යතා ඉටුකරන සංවිධානයක් විය යුතු වුවද සිදුවී තිබෙනුයේ ග්‍රාමීය මට්ටමේ දේශපාලනය ව්‍යාප්ත කිරීමේ ආයතනයක් වශයෙනි. එම නිසා ගොවීන් අකමැති වුවද ගොවි සංවිධාන නායකත්වය වෙනස් කිරීමට ඔවුන්ට හැකියාවක් නැත. හේතුව නායකත්වය සඳහා පුද්ගලයන් පත්කිරීමට දේශපාලන බලපෑම් ඇතිවන හෙයිනි. එනිසා ගොවි සංවිධානය අකර්මන්‍ය නාමික ප්‍රජා සංවිධානයක් වශයෙන් ගමෙහි පවතී. මෙහිදී පැනනගින ප්‍රශ්නය වනුයේ මෙවැනි අකර්මන්‍ය ගොවි සංවිධානයක් ගොවීන් බහුතරයක් ජීවත්වන ගමක පවතින්නේ කෙසේද යන්නයි. එහෙත් මෙයට හේතුව ලෙස මා දකිනුයේ ගොවි සංවිධානයක් මඟින් ගොවීන්ට ලැබිය හැකි විපුල ඵල ප්‍රයෝජන පිළිබඳව ගොවීන් අත්විදීමෙන් ලද දැනුමක් නොමැති බැවින් ඔවුන් ගොවි සංවිධානය ඔවුන්ගේ ජීවිතවලට බලපාන ප්‍රබල සංවිධානයක් වශයෙන් තැකීමක් නොකිරීමයි. ඔවුන් සිතනුයේ එය සංවිධානයක් ලෙස නාමිකව ගමේ පවතින තවත් එක් ප්‍රජා සංවිධානයක් වශයෙනි. ක්‍රියාකාරී ගොවි සංවිධානයක් තම ගොවීන් සඳහා අවශ්‍ය කෘෂි යෙදවුම් සහ අලෙවි පහසුකම් සැළසීම හා වෙනත් ගොවි ප්‍රජාව සඳහා සැළසිය යුතු බොහෝ දේ ඉටුකර දෙනු ලබයි. ප්‍රජා සංවිධානයක් වන ගොවි සංවිධානයට එම කටයුතු කිරීම සඳහා කැපවීමෙන් යුතුව කටයුතු කළහැකි ප්‍රජා නායකයින් සිටිය යුතුය.

එහෙත් මුදල් ඉපයීම සහ තරඟය මූලික කර ගත් ආර්ථික සමාජ පසුතලයක ජීවත්වන ප්‍රජාවක සෑම දෙනෙක්ම අන්‍යයන්ගේ සේවය සඳහා කැපවූ ස්වේච්ඡා සේවකයන් සොයා ගැනීම අපහසු කාර්යකි. වර්තමාන ආර්ථික රාමුව යටතේ පොදු හැඟීමෙන් යුක්තව කණ්ඩායම් වශයෙන් ආර්ථික ක්‍රියාවලීන්හි නිරතවීම සමාජය තුළින් ගිලිහී ගොස් ඇත. පැරණි ගමේ පැවති අත්තම, කයිය වැනි සාමූහික කෘෂිකාර්මික ජීවන රටාවේ අංග ගිලිහී ගොස් පෞද්ගලිකත්වය සහ මුදලට වැඩකිරීම ඒ තැනට ආදේශකවී ඇත. මෙවැනි ප්‍රජාවක් තුළ ප්‍රජා සංවිධාන බෝඩ් ලැල්ලට පමණක් සීමාවී පවතී.

## 4.7. ගොවි සෙවන

පක්ෂ දේශපාලනය ගැමි ජනතාව තුළට කාවැදී ඇති ආකාරය සහ එය ගැමි ජනතාව විසින් අයුතු ලෙස පරිහරණය කරන ආකාරය සහ ඔවුන් දේශපාලනික වශයෙන් දෙපිරිසකට බෙදී එක පිළකට විරුද්ධව අනිත් පිළ ක්‍රියාකිරීමට තරම් මෙහි ජනතාව දේශපාලනික වශයෙන් අභාවයකට පත්වසිටින බව පෙන්වන උදාහරණයකි ගොවි සෙවන ඉදිකිරීම පිළිබඳ වූ යෝජනාව. ගොවි සෙවන නම්වූ වැඩ සටහන රජයේ සංකල්පයක් අනුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද්දකි. මෙම සංකල්පයෙන් මූලිකව අපේක්ෂා කරනුයේ ග්‍රාමීය ගොවි ප්‍රජාවට එකතුවීමට හා රැස්වීම් පැවැත්වීමට මධ්‍යස්ථානයක් ඉදිකිරීමයි. මෙය ගොවි සෙවන නමින් හඳුන්වනු ලබන අතර, එය රජය විසින් අනුමත කරන ලද ආදර්ශන ආකෘතියක් මත ඉදිකළ යුතුය. මෙම ගමෙහිද ගොවි සෙවනක් ඉදිකිරීම සුදුසුය යන මූලික යෝජනාව ඉදිරිපත් කරන ලද්දේ ව්‍යාපෘති නිලධාරීන් විසිනි. වර්තමානයේ ගමේ ප්‍රජා මධ්‍යස්ථානය වශයෙන් යොදාගනු ලබන ගමේ මරණාධාර සමිති ගොඩනැගිල්ලේ ස්වරූපය වෙනස්කර එය ගොවි සෙවන බවට පරිවර්තනය කිරීමට මෙහිදී අදහස් ඉදිරිපත් විය. මරණාධාර සමිතියේ සාමාජිකයන් රැස්කර මෙම කරුණ ඔවුන්ට විස්තර කරදීමට ව්‍යාපෘති නිළධාරීහු කටයුතු කළහ. මරණාධාර සමිතියේ වැඩිකොටසක් ගොඩනැගිල්ල ඉදිකිරීමට කැමති වූ අතර තවත් කොටසක් අකැමැතිවූහ.

ගොවි සෙවන නම් සංකල්පය දේශපාලන සංකල්පයක් මත ඇති වූවක් බැවින් එම දේශපාලන පක්ෂයට හිතවත්කම් දැක්වූ පිරිසක් සහ ගොවි සෙවන සංවිධානයේ නායකයින්ද ඇතැම් පිරිසක් මෙම ගොවි සෙවන ඉදිකළ යුතුය යන හඬ ගම තුළ නැගීය. මෙම කාර්යය සඳහා ප්‍රදේශයේ පළාත් සභා හා ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරු ඇතුළු දේශපාලන වශයෙන් ගමේ ක්‍රියාකාරී පිරිස් එකතුවී ගම්මට්ටමෙන් දේශපාලන මුහුණුවරක් ගත්හ. එයින් ගම තුළ මෙම කරුණු මුල්කොට ගෙන දේශපාලනය හිස එසවූ අතර, එහිදී සිදුවූයේ ගොවි ජනතාව කොටස් දෙකකට බෙදීමයි. ගොවි සෙවන ගමේ සෑම දෙදෙනාටම පොදුවේ පාවිච්චි කළ හැකිවුවත් මෙතෙක් කලක් ව්‍යාපෘතිය සම්බන්ධව සහයෝගයක් නොදුන් පිරිසක් ගොවි සෙවන ඉදිකිරීමේ අදහසත් සමගම කරලියට පිවිසීමත් ඔවුන් එක් දේශපාලනික පක්ෂයකට අයත් පිරිසක් වීමත් ගමේ අනෙක් දේශපාලන පක්ෂයට අයත් පිරිස රිස්සුවේ නැත. ඔවුන් කළේ මරණාධාර සමිතියේ පැරණි සාමාජිකයින් මෙම ගොඩනැගිල්ලේ ස්වරූපය වෙනස්කරනවාට විරුද්ධව පෙළඹවීමයි. මෙම උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙසින් මෙම මරණාධාර සමිති ගොඩනැගිල්ල වෙනස් නොකරන ලෙස ඉල්ලා සිටින ලිඛිත ඉල්ලීමක් මරනාධාර සමිතියේ සාමාජිකයින් පිරිසකගේ අත්සන සහිතව ගලේවෙල ප්‍රාදේශීය ගොවිජන සේවා නිලධාරී වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කිරීමයි. ගොවි සෙවන ඉදිකිරීම හා සම්බන්ධව ගම තුළ මෙවැනි පිල් බෙදීමක් ඇතිවීමත් ඉන් එක් කොටසක් පවතින මරණාධාර ගොඩනැගිල්ල වෙනස්කරනවාට විරෝධය දැක්වීමත් අළුතින් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට තරම් ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැතිවීමත් හේතුවෙන් "ගොවි සෙවන" ඉදිකිරීම පිළිබඳව වූ වැඩ පිළිවෙල නතරවිය. මෙම සිද්ධිය තුළින් පෙනීගියේ ජනතාව අන්ධානුකරණයෙන් දේශපාලනය කර පින්නාගෙන සිටින අතර, බාහිරින් ලැබෙන සම්පත්වලින් ග්‍රාමීය ජනදිවියේ අනර්ඝත්වය උසස්කර ගැනීමට තරම් ඔවුන් දේශපාලනිකත්වයෙන් පැසුනු බවක් නොපෙන්වන බවයි.

### 4.8 පහසු ණය

**ජනතාව කල්පනාකරනුයේ ක්ෂණික ලාභ ප්‍රයෝජන සහ ඉතා කෙටි අනාගතයක් පිළිබඳව පමණි. මෙම ව්‍යාපෘතියේ එක් අංගයක් වනුයේ ගොවීන් සඳහා ඉතා පහසු කොන්දේසි මත ණය වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමයි. පහසු කොන්දේසි යන්න මෙහි ඉතා වැදගත්ය. කුඩා කණ්ඩායම්වල නායකයින් විසින් අනුමත කරනු ලබන තම කණ්ඩායම්වල සාමාජිකයින් සඳහා කෘෂිකාර්මික සහ ක්ෂණික ණය ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. මෙහි වාර්ෂික පොලිය 12%ක් තරම් අඩු මට්ටමක් ගොවීහු විසින්ම තීරණය කරගත්හ. මෙම ණය කන්නයක් සඳහා ලබාදිය යුතු අතර පොළියත් සමඟ ආපසු එකතු කර ගැනීමෙන් මූලික මුදල කන්නයෙන් කන්නය වර්ධනයවෙයි. මේ අනුව මෙම ණය මුදල චක්‍රීය මුදලක් වශයෙන් ගම තුළ වර්ධනය වන අතර කල්යාමේදී කෘෂිකාර්මික මෙන්ම ජනතාවගේ වෙනත් මූල්‍යමය අවශ්‍යතාවයන් සපුරාලීමට තරම් ශක්තිමත් අරමුදලක් බවට මෙය පත්වේ. එපමණක් නොව කෘෂිකර්ම තාක්ෂණ සහාය මධ්‍යස්ථානය මෙම මුදල ක්‍රියාත්මක වන මධ්‍යස්ථානයක් වන අතර මෙහි පොලියෙන් කොටසක් කෘෂි තාක්ෂණ සහායක මධ්‍යස්ථානයේ අදායමක් ලෙස වර්ධනය කර ගැනීමට පුළුවන්කම ලැබේ.**

ගොවි ජනතාවට අවශ්‍ය පොදු තාක්ෂණ සහායන් මුදල් ගෙවා ලබාගැනීමටද මෙම මුදල යෙදවිය හැකිය. එබැවින් මෙම මූලික මුදල ක්‍රමයෙන් වර්ධනය කරගනිමින් විශාල අරමුදලක් දක්වා වර්ධනය කරගැනීම කිහිප අතකින්ම වැදගත්බව පෙනේ. ගමේ ගොවීන්ට ඉතා පහසුවෙන් හා අවශ්‍ය අවස්ථාවල ගම තුළින්ම ණය මුදලක් ලබාගැනීමට අවස්ථාවක් ඇත්තේ නම් ඒ ඔවුන්ට ඉතාමත්ම වැදගත්ය. බැංකු වැනි මූල්‍ය ආයතනයකින් ණය මුදලක් ලබා ගැනීමේදී ගොවි ජනතාවට දැරීමට සිදුවන ආර්ථික හා සමාජීය පිරිවැය පිළිබඳව සලකන විට මෙවැනි අරමුදලක වැදගත්කම වඩාත්ම කැපීපෙනේ. එහෙත් 1996 හා 97 වර්ෂවලදී ලබාදුන් රු.150,000ක මුදල් ප්‍රමාණය තවමත් ආපසු ගෙවා නැත. එයට හේතු වශයෙන් ඔවුන් දක්වන්නේ 1996 යල් කන්නයේ නියඟය නිසා ඔවුන්ගේ වගා පාළු වූ බවයි. ඉන්පසුව 1997 යල කන්නයේ මිරිස් සහ ලොකු ළූණු ප්‍රමාණවත් මිලකට අලෙවිකර ගැනීමට නොහැකිවීමෙන් මෙම මුදල් ආපසු ගෙවීමට හැකියාවක් නොමැති බවයි. මෙම ණය ආපසු අයකර ගැනීම සඳහා ව්‍යාපෘති නිළධාරීන් ණය ලාභීන්ට කිහිපවතාවක්ම කරුණු පැහැදිලි කර දුන් අතර, ඒ සඳහාද විශාල වියදමක් දැරීමට සිදුවිය. මෙම ණය මුදල් ගෙවීම පැහැර හැරීම තුළින් ඔවුන් කල්පනාකරනුයේ රුපියල් හාරපන්දහසක මුදලක් නොගෙවා සිටීම තුළින් වර්තමානයේදී ක්ෂණිකව ඔවුන් ලබන ප්‍රතිලාභයයි. එහෙත් මෙම ගත් ණය මුදල් පොළියත් සමඟ ආපසු ගෙව්වේ නම් මීළඟ කන්නයේ වැඩි සංඛ්‍යාවකට ණය මුදල් ලබාදීමට පුළුවන්කම ලැබේ. එහෙත් මෙම කන්නය මුදල් පැහැර හැරීම තුළින් සිදුවනුයේ ගම තුළ ගොවීන් සැමට පොදුවේ පරිහරණය කිරීමට පොදු අරමුදලක්

ගොඩනැඟීමට තිබූ අවස්ථාව වැළකීයාමයි. මෙය දිගුකාළීන වශයෙන් පොදුවේ ගමට ලැබීමට හා වර්ධනයකර ගැනීමට තිබූ සම්පත් අහිමිකර ගැනීමකි. කෙටිකාලීන ක්ෂණික ලාභයක් වෙනුවෙන් අනාගතයේ විශාල වශයෙන් ප්‍රතිඵල ලබාගැනීමක් පිළිබඳව කිසිවකු දිගුකාළීන වශයෙන් සිතා නොබැලීම පිළිබඳව ප්‍රජාව විසින් ප්‍රදර්ශනය කරන ලද අවස්ථාවක් ලෙස මෙම සිද්ධිය දැක්විය හැකිය.

**5.විශ්ලේෂක බැලීමක්**

ව්‍යාපෘතියේ එක් එක් අවධිවල ක්‍රියාත්මක කරණ ලද කාර්යයන් පිළිබඳව මෙවැනි විශ්ලේෂණයක් කිරීමේදී පෙනීයන්නේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වී ඇත්තේ පුළුල් ප්‍රජා සහභාගිත්වයකින් තොරව වන අතර නිලධාරීන් විසින් ව්‍යාපෘතිය දුෂ්කරතා මධ්‍යයේ ඇදගෙන යාමයි. මෙසේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබන අවස්ථාවලදී පමණක් පිරිසක් ප්‍රතිලාභ ගැනීමට ඉදිරිපත් වී ලබා ගැනීමෙන් පසුව යලිත් ඔවුන් අතුරුදහන් වී ඇත. පහසු කොන්දේසි මත ණය සැපයීමේදී ණය ලබා ගැනීමට විශාල පිරිසක් ඉදිරිපත් වූ අතර, ණය ලබාගත් පුද්ගලයින් වර්තමාණයේ ව්‍යාපෘතිය මගහැරීමට උත්සාහ කිරීම නිදසුනක් වෙයි. මෙවැනි තත්ත්වයක් මෙම ව්‍යාපෘතිය තුළින් දක්නට ලැබුනේ සමාජ ව්‍යුහය තුළම පවතින යම් යම් ගුණාංග හේතුවෙනි. මෙම තත්ත්වය මොරගොල්ල ගමට පමණක් විශේෂිත වූවක් නොවන අතර, එය සමස්ථ ග්‍රාමීය සමාජයටම පොදු වූවකි. මෙවැනි ගතිලක්ෂණ ග්‍රාමීය ජනතාව තුළ ඇතිවී ඇත්තේ ඇයිදැයි සලකා බැලිය යුතුවෙයි.

**5.1 සංවර්ධන ව්‍යාපෘතීන් සහ රජයේ නිලධාරීන්**

ශ්‍රී ලංකාව නිදහස ලබාගත් අවදියේ ග්‍රාමීය සංවර්ධන කටයුතු සඳහා ග්‍රාමීය ජනතාවගේ සහාය යම් තරමකින් හෝ ලබාගන්නා ලදී. කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විවිධ නිලතල සමඟ ග්‍රාමීය ජනතාවගේ සෘජු සම්බන්ධතාවක් ඇතිකර තිබුනි. ඒ අනුව වැව් හා වාරිමාර්ග නඩත්තු කිරීම අළුත්වැඩියා වැනි කටයුතු ග්‍රාමීය ජනතාව විසින් සිදුකරන ලදී. එහෙත් පසු කාලීනව ශ්‍රී ලංකා රජය මඟින් ගෙන එන ලද පනත් අනුව මෙම සියළු කටයුතු රජය විසින් පවරා ගන්නා ලදී. ඉන්පසුව ගතවූ දශක කිහිපය තුළ ජනතාව තුළ වැඩුණු අදහස වූයේ ග්‍රාමීය සංවර්ධන කාර්යය මුළුමණින්ම රජය විසින්ම කළයුතු බවත් එයට කිසිලෙසකින් හෝ ජනතාව හවුල් විය යුතු නොවන බවත් ප්‍රතිඵල පමණක් ජනතාව භුක්ති විඳිය යුතු බවත්ය. මෙම මානසික තත්ත්වය වර්තමානයේදී ජනතාව තුළ තදින් මුල් බැසගෙන පැවතෙන අතර, අද එම තත්ත්වය ඔවුන් කෙරෙන් ඉවත් කිරීම අපහසු කාර්යයක් වී ඇත. මේ අනුව ජනතාව සිතනුයේ රජයේ වැටුප් ලබන නිලධාරීන් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ඇගයුම් කිරීම වැනි සියළුම අංගයන් කළ යුතු බවකි. මේ නිසා නිලධාරී පංතියත් ජනතාවත් අද පැති දෙකක සිටී. එසේ තත්ත්වය වර්ධනය වී ඇති අතර, ජනගහණය වැඩිවීම්, ලෝක ආර්ථික අවපාත, උද්ධමන හා විවිධ ආර්ථික අපහසුතා උග්‍රවත්ම සියළුම ග්‍රාමීය සංවර්ධන කාර්යයන් රජයට කරගෙන යාමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇතැයි වර්තමාන රජයයන්ට ප්‍රත්‍යක්ෂ වී ඇත. මෙයට පිළියමක් ලෙස සංවර්ධන කාර්යයන්හි ජනතාව වැඩි වැඩියෙන් සහභාගි කරවාගත යුතු බව සංවර්ධන විශේෂඥයින් දක්වන්නට වූ අතර ඒ අනුව සහභාගීත්ව ක්‍රමවේද සංවර්ධන කාර්යයන්හිදී එළි දැක්විණි. එසේ වුවද වර්තමානයේ ජනතාවගේ ආකල්පය වී ඇත්තේ සියල්ලම රජය මඟින් රජයේ නිලධාරීන් විසින් කළ යුතුය යන අදහස බැවින් ජනතාව සංවර්ධන ව්‍යාපෘතිවලට සතුටුදායක අන්දමින් සහභාගිකරවා ගැනීම අතිශය දුෂ්කර කටයුත්තක් වී ඇත. මේ නිසා කුමන ආකාරයේ සංවර්ධන කටයුත්තකට වුවත් ජනතාවගේ පූර්ණ සහයෝගය ලබාගැනීම අපහසු වී ඇත. මොරගොල්ල ව්‍යාපෘතියේදී ද ජනතා සහභාගිත්වය ලබා ගැනීමට විවිධ ක්‍රමවේද අනුගමනය කළද එය මුළුමණින්ම සාර්ථක නොවූයේ ජනතාව තුළ මුල් බැසගෙන ඇති මෙම ආකල්පය නිසා බව කිව හැකිය.

**5.2 සංවර්ධන ව්‍යාපෘතීන්හි ජනතා සහභාගිත්වය**

දැනට දශක කිහිපයකට පෙර ගම්බද සමාජයේ ග්‍රාමීය දිවිපෙවත සමත්විතවී තිබුනේ අන්‍යෝන්‍ය සාමූහිකත්වය මතය. ගොවිතැන් කටයුතුවලදී කයිය, අත්තම වැනිදේද ශ්‍රමදාන වැනි දේද ගම්බද සමාජ ක්‍රමයේ ආර්ථික සාමාජික කටයුතු පෝෂණය කරන ලදී. එම සාමූහික ජීවන ක්‍රමය ගැමි සමාජය ඔවුන් විසින්ම සංවර්ධනය කරගැනීමක් විය. එහෙත් විවෘත ආර්ථික ක්‍රමය ආරම්භවීමෙන් පසුව ගැමි සමාජයේ මෙම සාමූහික

**ග්‍රාමීය ජනතාව ජීවත්වීමට උත්සාහ දරනුයේ ඔවුන් කලක් තිස්සේ ජීවත්වූ ගතානුගතික ක්‍රමයටම වෙයි. ග්‍රාමීය ජනතාව ඔවුන්ටම ආවේණිකවූ පිළිවෙලකට දිවිපැවැත්මක් සකස්කරගෙන සිටී. මෙම දිවිපැවැත්ම සැකසී ඇත්තේ අතිශයින්ම සරළ ආකාරයටය. වර්තමානයේ විවෘත ආර්ථිකයත් සමග තරඟකාරී ජීවන රටාවකට ජනතාව හුරුපුරුදු වෙමින් සිටියද ග්‍රාමීය ජනතාව තුළ ඒ මුල්බැසගත් ගතානුගතික ක්‍රමයක් නොකැඩී පවතී. එසේ වුවද මොවුන් පුරුදු පුහුණුවී ඇත්තේ ඉතාසෙමින් හේනක් වගාකිරීමටත්, එයට පසුව කුඹුර වගාකිරීමටත් ආදී වශයෙනි. එහෙත් මෙම වගාවන් සඳහා ඉතා මහත්සියෙන් වැඩකොට ඉහළට අස්වනු ප්‍රමාණයක් ලබාගැනීමට උත්සාහ කිරීමක් දක්නට නැත. අඩු මහන්සියකින් පාරම්පරික ක්‍රම භාවිතාකරමින් වගාකර එයින් ලැබෙන ප්‍රතිඵලයක් පමණක් ලබාගැනීම ඔවුන්ගේ ක්‍රමය වේ.**

බව දෙදරාගොස් මුළු සමාජයම පෞද්ගලිකත්වය ගැන පමණක් කටයුතු කරන සමාජයේ තනි ආර්ථික ඒකක බවට ගැමි පවුල් පරිවර්තනය විය. ඒ අනුව ආර්ථික සාමාජික සෑම කර්තව්‍යයක්ම පොදුවේ නොව පෞද්ගලිකව කිරීමටත් ඒ සියල්ලටම මුදල්මය අගයකුත් ආරෝපනය විය. සමාජයේ ජීවත්වීම යනු කලින් පැවති සරළ ක්‍රමය නොව ඉතා දුෂ්කර මුදල් මුල්කරගත් තරඟකාරී කාර්යයක් බවට විවෘත ආර්ථිකය විසින් පත්කර ඇත. මෙම නව ප්‍රවනතාව ගැමි ජනයාගේ මනස තුළට තදින් කාවැදී ඔහු ඒ අනුව ක්‍රියාත්මක වන තත්ත්වයකට පත්ව ඇත. මේනිසා කිසිම පුද්ගලයෙකුට සමාජ සේවයේ යෙදිම හෝ පොදු වැඩකටයුතුවල යෙදීම හෝ ආර්ථික වශයෙන් බොහෝ පාඩු ගෙන දෙන්නක් බව සිතීමට පෙළඹී ඇති අතර එසේ ක්‍රියාකිරීමට පටන් ගෙන ඇත. මෙම පසුබිම තුළ වර්තමාන ග්‍රාමීය ජනතාව, ගොවි සංවිධානවල නිලතල හෝ වෙනත් ප්‍රජා සංවිධානයන්හි නිලතල, විවිධ රැස්වීම්වලට සහභාගිවීම සාකච්ඡා කුඩා කණ්ඩායම් ක්‍රම වැනි ක්ෂණික ආර්ථිකමය ප්‍රතිලාභයක් නොලබන කාර්යයන්හි නියැලීමට මැලිකමක් දක්වති. ඒනිසා ඒවා මඟහරවමින් සෑම විටම මුදල් උපයන කාර්යයක නිරත වීමේ මාවතකට ග්‍රාමීය සමාජය ඇදවැටී තිබේ. මෙම පසුබිම තුළ ජනතා සහභාගිත්ව ව්‍යාපෘතින්හි ජනතා සම්බන්ධය හා සහභාගිත්වය ඉතා අඩු මට්ටමක පැවතීම පුදුමවිය යුතු එමෙන්ම ග්‍රාමීය ජනතාවට දොස් පැවරිය යුතු කාර්යයක් නොව පවතින ආර්ථික ක්‍රමය විසින් ජනතාව එම තත්ත්වයට තල්ලුකර දැමීම හේතුවෙන් සිදුවූ දෙයකි.

## 5.3 දැනුවත් ගොවි ජනතාව

**බොහෝ ව්‍යාපෘතිවලදී ඒවායේ ප්‍රතිලාභවලින් වැඩිකොටසක් භුක්ති විදිනුයේ එම ව්‍යාපෘතිවල නියැලි නිලධාරීන් බවට මතයක් ගොවීන් තුළ පවතී. එසේ වනුයේ එවැනි තත්ත්වයක් පෙරදී පැවති බැවිනි. ඒවායේ ප්‍රතිලාභවලින් ගොවීන්ට ලැබෙනුයේ ඉතාම සුළු ප්‍රමාණයක් බවද ඔවුහු විශ්වාස කරති. එම නිසා ගොවීන් ඔවුන්ගේ ගම්පළාත්වලට එනු ලබන ව්‍යාපෘති දෙස බලනුයේ සැකයකිනි. එසේම ඔවුන් ඒවායේ පූර්ණ සහභාගිත්වයක් සහතික කරමින් හැම අවධියකදීම සහභාගිවෙමින් කටයුතු කිරීමට මැලිකමක් දක්වන අතර නිලධාරීන් විසින් සියල්ලම කිරීමට අවකාශය සලසා දී ඔවුන් නිහඬව සිටීමට උත්සුක වෙයි. අතිශය සුඛෝපභෝගී වාහන, විවිධ වර්ගයේ නිළ දීමනා, උසස්ම සැපසම්පත් සහිත ඉඳුම්හිටුම් වැනි ඉහළ වරප්‍රසාද භුක්ති විඳිමින් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පැමිණෙන නිලධාරීන් වෙත ග්‍රාමීය ජනතාව තුළ ඇත්තේ ගෞරවයක් නොව වෛරයකි. එමනිසා ඔවුන් මෙම නිළධාරීන් මඟහැර ඔවුන්ගේ පාඩුවේ සිය පෞද්ගලික ක්‍රියාවන්නහි නිරතවීමට උත්සාහ දරනු ලබයි. මෙම තත්ත්වය හේතුවෙන් අවංකවම ග්‍රාමීය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ගම්පළාත්වලට යනු ලබන නිලධාරීන් වෙතද ගම්මුන් දක්වන ආකල්ප ඉහත දැක්වූ අයුරින්ම වේ. අප ව්‍යාපෘතිය දෙස ද ගැමි ප්‍රජාව හෙළුවේ එවැනි බැල්මක්දැයි ඇතැම්විට මට සිතේ.**

## 5.4 ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති සහ ජනතා ආකර්ශනය.

ගම්බද ප්‍රදේශ සංවර්ධනය කිරීමේ අභිලාශය ඇතිව විවිධ සංවිධාන විසින් වර්තමානයේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබමින් සිටී. මෙසේ ක්‍රියාත්මක වනු ලබන බොහෝ ව්‍යාපෘතිවලින් ජනජීවිතයේ සංවර්ධනය සඳහා හරවත් යමක් සිදුවී නොමැත. එම නිසා ව්‍යාපෘතිවලින් ජන ජීවිතයේ ආකර්ශනයක් ඇදගැනීමට සමත්වී නැති බැවින් ජනතාවද එම ව්‍යාපෘති පිළිබඳ එතරම් කැක්කුමකින්

කටයුතු නොකරන තත්ත්වයට පත්වී ඇත. මෙම තත්ත්වය තුළ හැබැවටම ගැමි ජනතාවගේ ජීවිතවලට යම්කිසි සංවර්ධනයක් ඇතිකිරීමට උත්සාහ කරනු ලබන ව්‍යාපෘතිවලටද ග්‍රාමීය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වීම අපහසු වී ඇත. අප විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිය දෙසද ජනතාව බලන්නට ඇත්තේ මෙයද තවත් එක් ව්‍යාපෘතියක් පමණි යන හැඟීමෙන් විය හැකිය.

## 5.5 දෛවය හා කර්මය පිළිබඳ විශ්වාසය

ග්‍රාමීය ජනතාව ජීවත්වීමට උත්සාහ දරනුයේ ඔවුන් කලක් තිස්සේ ජීවත්වූ ගතානුගතික ක්‍රමයටම වෙයි. ග්‍රාමීය ජනතාව ඔවුන්ටම ආවේණිකවූ පිළිවෙලකට දිවිපැවැත්මක් සකස්කරගෙන සිටී. මෙම දිවිපැවැත්ම සැකසී ඇත්තේ අතිශයින්ම සරළ ආකාරයටය. වර්තමානයේ විවෘත ආර්ථිකයත් සමඟ තරඟකාරී ජීවන රටාවකට ජනතාව හුරුපුරුදු වෙමින් සිටියද ග්‍රාමීය ජනතාව තුළ ඒ මුල්බැසගත් ගතානුගතික ක්‍රමයන් නොනැසී පවතී. එසේ වුවද මොවුන් පුරුදු පුහුණුවී ඇත්තේ ඉතාසෙමින් හේනක් වගා කිරීමටත් එයට පසුව කුඹුර වගාකිරීමටත් ආදී වශයෙනි. එහෙත් මෙම වගාවන් සඳහා ඉතා මහන්සියෙන් වැඩකොට ඉහළට අස්වනු ප්‍රමාණයක් ලබාගැනීමට උත්සාහ කිරීමක් දක්නට නැත අඩු මහන්සියකින් පාරම්පරික ක්‍රම භාවිතා කරමින් වගාකර එයින් ලැබෙන ප්‍රතිඵලයක් පමණක් ලබාගැනීම ඔවුන්ගේ ක්‍රමය වේ. මේ ජීවිතය තුළ දක්නට ලැබෙන්නේ ගම තුළ ජීවත්වෙමින් තමා අවට පරිසරය හා ගැටෙමින් එහෙත් එතරම් ශීඝ්‍රගාමී නොවන ඉතා මන්දගාමී වේගයකින් තමා අවට සම්පත් පරිහරණය කරමින් අඩු ආදායමක් ලබා ගනිමින් අල්පේච්ඡ දිවිපෙවතක් ගතකිරීමයි. එම වටිනාකම ඔවුන්ගේ ජීවිතවලට කාවැදී ඇති නිසා ඔවුන්ට කොතෙක් කෘෂිකර්මයේ නවීන ක්‍රම පිළිබඳව කියා දුන්නද සාමූහික යෙදවුම් ලබාගැනීම් හා සාමූහික නිෂ්පාදන අලෙවික්‍රම ආදිය පිළිබඳව ආදර්ශන පවත්වමින් ඔවුන් වඩාත් ලාබදායී කෘෂිකාර්මික ක්‍රමයක් වෙත රැගෙනයාමට උත්සාහ කළද ඔවුහු ඒ වෙත පැමිණීමට මැලිකමක් දක්වති. ඔවුන් විශ්වාස කරන පරිදි ඔවුන් වර්තමානයේ ගෙවන දිවිපෙවත ඔවුන්ට ප්‍රමාණවත්ය. වෙනත් නවීන වගාක්‍රම, නවතම බෝග රටා සහිත සංකීර්ණ සහ කඩිනම් ජීවිතයක් ගත කිරීමට ඔවුන්ගේ කැමැත්තක් නැත. ඔවුහු කර්මය යන්න දැඩි ලෙස විශ්වාස කරති. පෙර භවයේ කරන ලද පින් - පව් අනුව මේ බවයේ සියල්ල සිදුවෙතියි ඔවුන්ගේ විශ්වාසය අනුව කෘෂිකර්මයේ යෙදීමෙන් ලැබෙන අස්වනු ප්‍රමාණය කෙතෙක්ද එය බාර ගැනීමට ඔවුන් කැමැත්තෙන් සිටී. ඇයි එය ඔවුන්ගේ දෛවය අනුව ඔවුන්ට ලැබිය යුතු අස්වනු ප්‍රමාණයයයි ඔවුන් විශ්වාස කරන බැවිනි. එබැවින් නවතම වගා ක්‍රම හෝ නවතම සංවිධාන ක්‍රම මෙම කෘෂි සමාජය තුළ ඇති කිරීමෙන්, මෙම ඉරණමෙන් හෝ කර්මය වෙනස්කර වඩා හොඳ ජීවන තත්ත්වයක් ඇති කිරීමට පුළුවන්කමක් නැතැයි ඔවුහු තදින් විශ්වාස කරති. මෙම තත්ත්වය තුළ මොරගොල්ල ජනතාවද සිටින බව ඔවුන්ගේ ක්‍රියාකාරකම් අනුව පෙනීයයි.

## 5.6 සමාජය තුළ පවතින පසුගාමීබව

මෙම ජනතාව බොහෝ අංශයන්ගෙන් විශාල පසුගාමී බවක් පෙන්වයි. කුඩා කණ්ඩායම් සෑදීමේදීත් ඒවා සඳහා නායකයන් පත්කිරීමේදීත්, ග්‍රාමීය සංවර්ධන සභාව සඳහා නායකයන් පත්කිරීමේදිත්, රැස්වීම්වලට පැමිණීම සහ අදහස් ප්‍රකාශ කිරීමේදීත් ඔවුන් ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළ ව්‍යාපෘතිවලදීත් ඉහතින් විස්තර කරන ලද ආකාරයෙන් මෙම ජනතාව පෙන්වූයේ මහත් පසුගාමී බවකි. මොවුන් වර්තමානයේ සිටින දරිද්‍රතාවයෙන් ගොඩඒමට නොහැකිවී ඇත්තේද මෙම පසුගාමී බව හේතුවෙනි. මොවුන් සෑම විටම ජීවත්වීමට කැමැත්තෙන් සිටිනුයේ නොහැකියාව සහ අධෛර්යය පෙරටුකොටගත් කුසීත ජීවිතයකය. මෙහිදී මොවුන් සෑම විටම රජයේ හෝ වෙනත් සංවිධානවලින් යම්කිසි ආධාරයක් මූල්‍යමය වශයෙන් හෝ ද්‍රව්‍යමය වශයෙන් හෝ බලාපොරොත්තු වේ. එසේ නොමැතිව ස්වශක්තිය තමා වටේ ඇති සම්පත් සහ රජයේ යටිතල පහසුකම් ප්‍රයෝජනයට ගනිමින් උසස් ජීවන මට්ටමක් කරා එළඹීමට දක්වන දක්ෂතාව ඉතා පහත් මට්ටමක පවතී.

## 5.7 සහනාධාර හා දීමනා

වියළි කලාපිය ප්‍රදේශ සංවර්ධනය කිරීමේ උත්සාහය ආරම්භවූ 1950 දශකයේ සිට වැව් අමුණු ප්‍රතිසංස්කරණය කිරීම් ගොවි ජනපද ඇති කිරීම් වැනි වැඩ සටහන් රැසක් ආරම්භ විය. මෙම වැඩසටහන්වලදී දේශිය සහ විදේශීය මුදල් විශාල

ප්‍රමාණයක් වැය කරමින් එම ජනතාව සඳහා ආහාර ද්‍රව්‍ය කෘෂි උපකරණ ඇතුළු ජීවත්වීම සඳහා අවශ්‍ය සියළු දේ සපයා දෙනු ලැබීය. මින්පසුවද විවිධ ව්‍යාපෘති මාර්ගයෙන් ගොවීන් වෙත විවිධ දේ ලබාදෙනු ලැබීය. මෙම තත්ත්වය මත වියළි කලාපීය ගොවි ප්‍රජාව පිටතින් යමක් ලබාගැනීමේ මානසිකත්වයකට හුරුපුරුදු වී සිටී. මේ නිසා ගමට ව්‍යාපෘතියක් පැමිණෙනවායයි දැනගත් පමණින් ජනතාවගේ මනස් තුළ ඇති වනුයේ මෙම ව්‍යාපෘතිය තුළින් යමක් ලබාගැනීමේ බලාපොරොත්තුවයි. එබැවින් ක්ෂණිකවම යම්කිසි දෙයක් නොලැබෙන ප්‍රතිඵල ඈතින් දිස්වන ව්‍යාපෘති සඳහා ජනතා සහභාගිත්වය ඉතා පහත් මට්ටමක වෙයි.

**5.8 රාජ්‍ය අංශයේ පවතින නිලබල ක්‍රමය සහ ග්‍රාමීය ප්‍රශ්න**

ගොවි කටයුතු පර්යේෂණායතනය වැනි රාජ්‍ය ආයතන ක්‍රියාත්මක වනුයේ යම්කිසි නිලබල ක්‍රමයක් යටතේයි. මෙහිදී අවශ්‍යතාව අනුව අවශ්‍ය වේලාව අනුව ක්ෂේත්‍රයට යාමට මෙන්ම එහි වැඩකිරීමට අවශ්‍ය නිදහස පර්යේෂකයින්ට නැති තරම්ය. අප වැඩකළ යුත්තේ රාජ්‍ය ආයතනයක් වශයෙන් ආයතන නීතිමය රාමුවක් යටතේයි. මේ නිසා ක්ෂේත්‍රය සම්බන්ධව අප විසින් ක්ෂණිකව කළ යුතු වැඩකටයුතු බොහෝ සෙයින් අතපසු වී යයි. මෙම තත්ත්වය තුළ ක්ෂේත්‍රයේදී සැමවිටම රාජ්‍ය නිලධාරීන් දෘශ්‍යමාන නොවේ. මෙය ගොවි ජනතාව දකින්නේ යම්කිසි අඩුවක් ලෙසිනි. සැම විටම ගමට පිටස්තර නිලධාරීන් විසින් සංවර්ධනය දෙසට ජනතාව කැඳවාගෙන යාමක් ඔවුන් බලාපොරොත්තු වේ. එහෙත් ආයතන නීතිරීති පද්ධතියක් මැද වැඩකටයුතු කරනු ලබන අප පර්යේෂකයින්ට නිරන්තරයෙන් ක්ෂේත්‍රයේ දෘශ්‍යමාන වීමට පුළුවන්කමක් නැත. එහෙත් මෙම තත්ත්වය රාජ්‍ය නොවන සංවිධානවලට අදාළ නොමැත. ඒවායේ ඇති නම්‍යශීලී පාලන ක්‍රමය අනුව ක්ෂේත්‍ර කටයුතු කරන්නන්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක ක්ෂේත්‍රයට යාමට සහ අවශ්‍ය අවස්ථාවල අවශ්‍ය පරිදි තීරණ ගැනීමට නිදහස ඇත. මේ නිසා ග්‍රාමීය ප්‍රජාවගේ විශ්වාසය තදින් දිනාගැනීමට සහ ඔවුන්ගේ සහයෝගයෙන් වඩාත් උසස් ලෙසින් ලබාගැනීමට අවකාශ ඇත. වඩාත් සිත්ගන්නා සුළු උපක්‍රම භාවිතා කරමින් ග්‍රාමීය ජනතාව වෙත එළඹීමට හැකියාව මත ව්‍යාපෘති සාර්ථක වීමට හේතුවේ.

ග්‍රාමීය ප්‍රජාවට බලපාන ඉතා වැදගත් ප්‍රශ්නයන් කිහිපයක් ඕනෑම ක්ෂේත්‍රයක වෙයි. මෙවැනි ප්‍රශ්න සඳහා විසඳුම් ලබාගැනීම ව්‍යාපෘතිවලදී ජනතාව බලාපොරොත්තුවේ. එහෙත් මා කලින් සඳහන් කළ ආකාරයට ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වැනි රාජ්‍ය ආයතනවලට එම ප්‍රශ්න සඳහා කඩිනමින් විසඳුම් සපයාදීමට නොහැකි වෙයි. හේතුව ඒවා නීතිරීති පද්ධතියක් තුළින් පාලනය වීමයි. එමනිසා එම නීතිරීතිවලින් ඔබ්බට ගොස් එම ප්‍රශ්න සඳහා විසඳුම් ලබාදීමට පුළුවන්කමක් නැත. එසේම රාජ්‍ය ආයතනවල තීරණ ගැනීමේ සිට ඒවා ක්‍රියාත්මක මට්ටම දක්වා යාමට අඩියරයන් කිහිපයක් පසුකළ යුතුවෙයි. එවිට දිගුකලක් ගතවී ඇති බැවින් ප්‍රශ්නයට විසඳුම් අවශ්‍ය කාලය පසුවී ඇත. එම මූලික ප්‍රශ්නවලට විසඳුම් ඉතාම අත්‍යාවශ්‍ය බැවින් ඒවාට විසඳුම් ජනතාව ඉතා උවමනාවෙන් බලාපොරොත්තුව සිටී. එහෙත් ඒවාට අවශ්‍ය නිසි විසඳුම් උවමනා කාලයට නොලැබුණහොත් ගොවීන්ට එයින් දැනෙන බලපෑමක් නොවන නිසා ගොවීන් සිතනුයේ මෙම ව්‍යාපෘතිවලින් ඔවුන්ට සැබෑ ප්‍රයෝජනයක් නොලැබෙන බවයි. එබැවින් එවැනි ව්‍යාපෘතිවලට සහභාගිවීම තම කාලය විනාශ කරන්නක් පමණක් බව ඔවුහු සිතති. උදාහරණ වශයෙන් මොරගොල්ල ගමෙහි අප විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහනේ ඒ ප්‍රදේශයේ දැවෙන ප්‍රශ්න බවට පත්ව ඇති ලොකු ළූණු බීජ සපයාදීම පිළිබඳ ප්‍රශ්නයට සහ ලොකු ළූණු අස්වැන්න නෙළීමෙන් පසුව එය සාධාරණ මිලකට අලෙවිකර දීම පිළිබඳ ප්‍රශ්නය යන ප්‍රශ්න දෙකටම විසඳුම් ලබාදීමට පුළුවන්කමක් වූයේ නැත. ඒවා විසඳීමට අවශ්‍යකරන නම්‍යතාව අපසතුව නොමැතිවීම ඊට හේතුවයි. එම නිසා ගොවීන් ව්‍යාපෘතිය කෙරෙහි දක්වන සැලකිල්ල යම්කිසි ප්‍රමාණයකට අඩුවීමට මෙය හේතුවූ බව කිව හැකිය.

**6. අවසාන නිගමනය**

මෙවැනි තත්ත්වයක් මෙම ව්‍යාපෘතිය තුළින් දැකිය හැකිවූයේ එම සමාජය තුළම පවතින එයට කිඳාබැස ඇති ඉහත සඳහන් කළ පසුබිම හේතුවෙනි. ඊට අමතරව විවෘත ආර්ථික රාමුව නැමති විශාල ප්‍රවාහයට සමස්ථ සමාජය හසුවී සිටී. එම ප්‍රවාහය ආංශිකව නවතා වෙනත් ආකෘති අනුව ජන සමාජය හසුරුවමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට දරණ උත්සාහයකදී ඉහත ආකාරයේ ප්‍රශ්න, ගැටළු සහ අපහසුතාවලට මුහුණ පෑමට සිදුවීම ස්වාභාවික බව අවසාන වශයෙන් සඳහන් කළ යුතුය.